# මධ්‍යම පළාතේ පළාත් පාලන ආයතනවල රියදුරු ( ප්‍රාථමික ශිල්පීය) සේවා ව්‍යවස්ථාව

01. නම : මෙම සේවා ව්‍යවස්ථාව මධ්‍යම පළාතේ පළාත් පාලන ආයතනවල රියදුරු ( ප්‍රාථමික ශිල්පීය ) සේවා ව්‍යවස්ථාව ලෙස හඳුන්වනු ලැබේ.

02. ක්‍රියාත්මක වන දිනය : මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරනු ලබන දිනය වේ.

03. පත්කිරීම් බලධරයා පිළිබඳ විස්තර

3.1 පත්කිරීම් බලධරයා : මධ්‍යම පළාත් සභාවේ මහ නගර සභාවක් සම්බන්ධයෙන් නාගරික කොමසාරිස්වරයාද, නගර සභාවක් සම්බන්ධයෙන් නගර සභාවේ ලේකම්වරයාද හා ප්‍රාදේශීය සභාවක් සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයාද වේ.

3.2 තනතුර අයත් ආයතනය : මධ්‍යම පළාතේ පළාත් පාලන ආයතන

3.3 තනතුර අයත් අමාත්‍යාංශය: මධ්‍යම පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යාංශය

04. සේවක ගණය පිළිබඳ විස්තර

4.1 සේවක ගණය : ප්‍රාථමික ශිල්පීය

4.2 සංයුතිය :

මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතන වල රියදුරු සේවයේ සංයුතිය පහත දැක්වෙන පරිදි වේ.

(අ). III වැනි ශ්‍රේණියට බඳවාගනු ලබන අය
(ආ) II වැනි ශ්‍රේණියට උසස් කරනු ලබන අය
(ඇ) I වැනි ශ්‍රේණියට උසස් කරනු ලබන අය
(ඈ) විශේෂ ශ්‍රේණියට උසස් කරනු ලබන අය

4.3 පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය : මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල ක්‍රියාත්මක කරනු ලබන කාර්යයන්හි දී මූලික අවශ්‍යතාවයක් වන ප්‍රවාහනය සම්බන්ධ කාර්යයන්ගෙන් සමන්විත වූ කාර්යභාරයක් සහ නාගරික කොමසාරිස් / ලේකම් විසින් සේවයේ අවශ්‍යතාවය මත පවරනු ලබන රාජකාරි කටයුතුද මෙම තනතුරු දරන්නන්ට පැවරේ.

05. තනතුරේ ස්වභාවය :ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත වේ.

06. අර්ථ නිරූපණ හා නිර්වචන :

6.1 "ව්‍යවස්ථාව" යන යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතන වල රියදුරු සේවා ව්‍යවස්ථාවයි.

6.2 "ආණ්ඩුකාරවරයා" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා වේ.

6.3 "දෙපාර්තමේන්තු ප්‍රධානියා" යනුවෙන් අදහස් කරනුයේ මහ නගර සභාවක් සම්බන්ධයෙන් නාගරික කොමසාරිස්වරයාද, නගර සභාවක් සම්බන්ධයෙන් නගර සභාවේ ලේකම්වරයාද හා ප්‍රාදේශීය සභාවක් සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා ද වේ.

6.4 "සේවය" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල රියදුරු සේවයයි.

6.5 "සක්‍රිය සේවා කාලය" යනුවෙන් අදහස් කරනුයේ රජයේ, මධ්‍යම පළාත් සභාවේ හා පළාත් පාලන ආයතනවල ව්‍යවස්ථාවන්ට හෝ/හා රජයේ, මධ්‍යම පළාත් සභාවේ හා පළාත් පාලන ආයතනවල ප්‍රතිපත්තිමය හේතුවලට යටත්ව ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින්, තමාට පැවරෙන රාජකාරියෙහි සත්‍ය වශයෙන්ම සේවය කරන ලද කාල සීමාව වේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2013-05-21 දින
අනුමත කරන ලදී
ආණ්ඩුකාර ලේකම්

6.6 "ක්‍රියාත්මකවන දිනය" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් මෙම ව්‍යවස්ථාව අනුමත කරනු ලබන දිනයයි.

6.7"කොමසාරිස් " යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන කොමසාරිස්වරයා වේ.

6.8 "සතුටුදායක සේවය" යනුවෙන් අදහස් කරනුයේ රජයේ/ මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවයේ/ පළාත් පාලන ආයතනයක සේවකයෙකු ලෙස කාර්යක්ෂමව හා අනලස්ව රාජකාරිය ඉටුකිරීම මගින්ද, සමත් විය යුතුව තිබූ කාර්යක්ෂමතා කඩඉම් සමත්වීම මගින්ද සිදුකල යුතුව තිබූ පත්වීම ස්ථිර කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම මගින් ද එම කාලය තුළදී උපයාගතව තිබූ සියළුම වැටුප් වර්ධක උපයාගෙන ඇත්තාවූ සහ අවවාද කිරීමක් හැර වෙනත් යම් ආකාරයක විනයානුකූල දඬුවමකට යටත් නොවන කාලසීමාවක් වන්නේය.

07. වැටුප්

7.1 වැටුප් කේත අංකය : රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 (A) හි PL - 03

7.2 වැටුප් පරිමාණය :

රු. 12470 – 10 × 130 -10 × 145 – 10 × 160 -12 × 170 –රු. 18,860

7.3 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර :

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | වැටුප් තලය ( රු) |
|---|---|---|
| III | 01 | 12,470/- |
| II | 12 | 13,915/- |
| I | 22 | 15,380/- |
| විශේෂ ශ්‍රේණිය | 32 | 16,690/- |

08. සේවක ගණයට අයත් තනතුරු :

8.1 අනුමත තනතුරු හා අනුමත තනතුරු සංඛ්‍යාව

| අනුමත තනතුර | අනුමත තනතුරු සංඛ්‍යා | කාර්යයන් |
|---|---|---|
| පළාත් පාලන ආයතනවල රියදුරු | පළාත් පාලන ආයතනවල රියදුරු යනුවෙන් මෝටර් රථ රියදුරු, ට්‍රැක්ටර් රියදුරු, ලොරි රියදුරු,ගිලන් රථ රියදුරු, එන්ජින් රියදුරු, ඩෝසර් ක්‍රියාකරු, බැකෝ ලෝඩර් ක්‍රියාකරු, ගල්රෝල් ක්‍රියාකරු යන තනතුරු සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කරන ලද තනතුරු සංඛ්‍යාව | මූලික අවශ්‍යතාවයක් වන ප්‍රවාහනය සම්බන්ධ කාර්යයන්ගෙන් සමන්විත වූ කාර්ය භාරයක් සහ නාගරික කොමසාරිස්/ලේකම් විසින් සේවයේ අවශ්‍යතාවය මත පවරනු ලබන රාජකාරී කටයුතුද මෙම තනතුරු දරන්නන්ට පැවරේ. |

8.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව :

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් එක් එක් පළාත් පාලන ආයතන සඳහා අනුමත කරන ලද තනතුරු සංඛ්‍යාව

(ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්යය සඳහා III, II, I ශ්‍රේණීන් හා විශේෂ ශ්‍රේණිය යන සියල්ල ඒකාබද්ධ සේවක සංඛ්‍යාවට අයත් සේ සැලකේ.)

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2013-05-21 දින
අනුමත කරන ලදී
ආණ්ඩුකාර ලේකම්

09. බඳවා ගැනීමේ ක්‍රමය

9.1 බඳවා ගන්නා අනුපාතය

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 70% |
| සීමිත | 30% |

9.2 විවෘත බඳවා ගැනීම

9.2.1. බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය

9.2.2. සුදුසුකම් :

9.2.2.1 අධ්‍යාපන සුදුසුකම් : අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන 02 ක් සහිතව විෂයයන් 06ක් සමත්ව තිබීම, මින් විෂයන් 05ක් එක් වරකදී සමත්වී තිබිය යුතුයි.

9.2.2.2 වෘත්තීය සුදුසුකම් : මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ එක් එක් තනතුර සඳහා අදාළ වන කාණ්ඩයේ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම. ඊට අමතරව යන්ත්‍ර ක්‍රියාකරු තනතුරු සඳහා රජයේ පිළිගත් ආයතනයකින් ලබාගත් ජාතික වෘත්තීය සුදුසුකම් 4 වෙනි මට්ටම (NVQ - 4) පුහුණු සහතිකය යන්ත්‍ර ක්‍රියාකරවීමේ පුහුණු සහතිකය.(එක් එක් තනතුරට අදාළ සුදුසුකම් 13 ඡේදයේ සඳහන් වේ.)

9.2.2.3 පළපුරුද්ද : මෝටර් රථ පැදවීමේ බලපත්‍රය ලැබීමෙන් පසු අවම වසර 03 ක පළපුරුද්ද ලබා තිබීම (පළපුරුද්ද සහතික මගින් සනාථ කළ යුතුය.)

9.2.2.4 කායික සුදුසුකම් :

I. සෑම අපේක්ෂකයෙකුම මනා ඇස් පෙනීමක් තිබිය යුතු අතර දිවා කාලයේදී සහ රාත්‍රී කාලයේදී සේවයේ යෙදීම පිණිස ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය

II. අවම උස අඩි 05 අඟල් 02,1/2 ක් විය යුතුය.

9.2.2.5 වෙනත් :

I. පරම්පරාවෙන් හෝ ලියාපදිංචියෙන් ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

II.අයදුම්කරු අදාළ පළාත් පාලන ආයතන බල ප්‍රදේශය තුළ වසර 03 කට නොඅඩු ස්ථිර පදිංචි අයෙකු විය යුතුය.

III.මහාමාර්ග නීති සංග්‍රහය ගැන මනා දැනුමකින් යුක්ත විය යුතුය.

IV.බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළු සුදුසුකම්, එම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2013-05-21 දින
අනුමත කරන ලදී
ආණ්ඩුකාර ලේකම්

9.2.3 වයස :

9.2.3.1. අවම සීමාව : අවුරුදු 18යි.

9.2.3.2. උපරිම සීමාව : අවුරුදු 45යි.

9.2.4 බඳවා ගැනීමේ ක්‍රමය :ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලැබූ අපේක්ෂකයන්ගෙන් වෘත්තීය පරීක්ෂණයක ප්‍රතිඵල මත අවශ්‍ය සියලුම සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන්ගෙන් ඉහළම ලකුණු ලැබූවන් අතුරින් කුසලතා අනුපිළිවෙළ අනුව බඳවාගනු ලැබේ.

9.2.4.1 ලිඛිත විභාගය : 01 වන පරිශිෂ්ටයේ සඳහන් පරිදි ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලැබූ අපේක්ෂකයන්ගෙන් පවතින පුරප්පාඩු මත වෘත්තීය පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

9.2.4.2 වෘත්තීය පරීක්ෂණය :

| පරීක්ෂා කර ලකුණු ලබාදෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. රිය පැදවීමේ නිපුණතාවය / යන්ත්‍ර ක්‍රියාකරවීමේ නිපුණතාවය | 40 | ලිඛිත පරීක්ෂණයෙන් මුළු ලකුණු 40%ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් අය පමණක් ප්‍රායෝගික පරීක්ෂණය මණ්ඩලය විසින් පවත්වනු ලබන රිය පැදවීමේ නිපුණත්වය මැනීමේ වෘත්තීය පරීක්ෂණයට පෙනී සිටිය යුතුය. අවශ්‍ය සියළුම සුදුසුකම් පරීක්ෂා කරනු ලැබීමෙන් පසු ඉහළම ලකුණු ලැබූවන් අතුරින් කුසලතා අනුපිළිවෙළ අනුව බඳවාගනු ලැබේ. |
| 2. මහා මාර්ග නීති පිළිබඳව ප්‍රායෝගික දැනුම | 40 | |
| 3. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | 20 | |
| මුළු ලකුණු සංඛ්‍යාව | 100 | |

9.2.4.2.1 වෘත්තීය පරීක්ෂණය මණ්ඩලය පත්කරන බලධරයා :-
මධ්‍යම පළාතේ පළාත් පාලන කොමසාරිස්.

9.2.4.2.2 වෘත්තීය පරීක්ෂණ මණ්ඩලය පහත සඳහන් නිලධාරීන්ගෙන් සමන්විත තිදෙනෙකුට නොඅඩු පරීක්ෂණ මණ්ඩලයක් මගින් පැවැත්විය යුතු වේ.

i. අදාල පළාත් පාලන ආයතනයේ නාගරික කොමසාරිස් / ලේකම් විසින් පත්කරනු ලබන විධායක නිලධාරියෙකු එක් නියෝජිතයෙකු ලෙස.

ii. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ මෝටර් රථ වාහන පරීක්ෂකයෙකු,

iii. පොලිස් රථ වාහන අංශයේ නිලධාරියෙකු

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2013-05-21 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

9.2.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය :
රජයේ ගැසට් පත්‍රයේ හෝ දිනපතා ප්‍රසිද්ධ පුවත්පත් වල පළ කරනු ලබන දැන්වීමක් මගින්.

9.3 සීමිත බඳවා ගැනීම :

දැනටමත් අදාළ පළාත් පාලන ආයතනයේ තනතුරක ස්ථිර කර ඇති මූලික සුදුසුකම් සපුරා ඇති සේවකයන් සඳහා අදාළවේ.

9.3.1. බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය

9.3.2. සුදුසුකම් :

9.3.2.1 අධ්‍යාපන සුදුසුකම් : අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන 02 ක් සහිතව විෂයයන් 06ක් සමත්ව තිබීම, මින් විෂයන් 05ක් එක් වරකදී සමත්වී තිබිය යුතුයි.

9.3.2.2 වෘත්තිය සුදුසුකම් : මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කල එක් එක් තනතුර සඳහා අදාළ වන කාණ්ඩයේ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම. ඊට අමතරව යන්ත්‍ර ක්‍රියාකරු තනතුරු සඳහා රජයේ පිළිගත් ආයතනයකින් ලබාගත් ජාතික වෘත්තීය සුදුසුකම් 4 වෙනි මට්ටම (NVQ - 4) පුහුණු සහතිකය යන්ත්‍ර ක්‍රියාකරවීමේ පුහුණු සහතිකය.(එක් එක් තනතුරට අදාල සුදුසුකම් 13 ඡේදයේ සඳහන් වේ.)

9.3.2.3 පළපුරුද්ද : මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලැබීමෙන් පසු අවම වසර 03 ක පළපුරුද්ද ලබා තිබීම (පළපුරුද්ද සහතික මගින් සනාථ කළ යුතුය.)

9.3.2.4 කායික සුදුසුකම් :

I. සෑම අපේක්ෂකයෙකුම මනා ඇස් පෙනීමක් තිබිය යුතු අතර දිවා කාලයේදී සහ රාත්‍රි කාලයේදී සේවයේ යෙදීම පිණිස ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

II. අවම උස අඩි 05 අඟල් 02,1/2 ක් විය යුතුය.

9.3.2.5 වෙනත් :

I. අයදුම්කරු අදාළ පළාත් පාලන ආයතන බල ප්‍රදේශය තුළ වසර 03 කට නොඅඩු ස්ථිර පදිංචි අයෙකු විය යුතුය.

II. මාර්ග නීති සහ මාර්ග සංඥා පිළිබඳ මනා දැනුමකින් යුක්ත විය යුතුය.

III.බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළු සුදුසුකම්, එම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

9.3.3 වයස :

9.3.3.1. අවමසීමාව : අවුරුදු 18යි.

9.3.3.2. අදාළ පළාත් පාලන ආයතනයේ සේවයේ යෙදී සිටින අය සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2013-05-21 දින
අනුමත කරන ලදී
ආණ්ඩුකාර ලේකම්

9.3.4 බඳවා ගැනීමේ ක්‍රමය :

කායික මානසික යෝග්‍යතාවය සහ අධ්‍යාපන, වෘත්තීය හා පොදු සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා වන සම්මුඛ පරීක්ෂණයක් සමඟ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් ලබා ගන්නා ප්‍රතිඵල මත සුදුසුකම් ලබන්නන් මෝටර් රථ පරීක්ෂක විසින් පවත්වන ප්‍රායෝගික පරීක්ෂණයක දී සුදුසුකම් ලබා ගත යුතුය.

9.3.4.1 ව්‍යුහගත පරීක්ෂණය :

9.3.4.1.1 ව්‍යුහගත සමුමුඛ පරීක්ෂණය මණ්ඩලය පත්කරන බලධරයා :-
මධ්‍යම පළාතේ පළාත් පාලන කොමසාරිස්

9.3.4.1.2 වෘත්තීය පරීක්ෂණ මණ්ඩලය පහත සඳහන් නිලධාරීන්ගෙන් සමන්විත, තිදෙනෙකුට නොඅඩු පරීක්ෂණ මණ්ඩලයක් මගින් පැවැත්විය යුතු වේ.

i. අදාල පළාත් පාලන ආයතනයේ නාගරික කොමසාරිස් / ලේකම් විසින් පත්කරනු ලබන විධායක නිලධාරියෙකු එක් නියෝජිතයෙකු ලෙස.
ii. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේනතුවේ මෝටර් රථ වාහන පරීක්ෂකයෙකු,
iii. පොලිස් රථ වාහන අංශයේ නිලධාරියෙකු

| පරීක්ෂා කර ලකුණු ලබාදෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. රිය පැදවීමේ නිපුණතාවය | 40 | ලිඛිත පරීක්ෂණයෙන් මුළු ලකුණු 40%ක් හෝ ඊට වැඩි අය පමණක් ප්‍රායෝගික පරීක්ෂණය මණ්ඩලය විසින් පවත්වනු ලබන රිය පැදවීමේ නිපුණත්වය මැනීමේ වෘත්තීය පරීක්ෂණයට පෙනී සිටිය යුතුය. අවශ්‍ය සියළුම සුදුසුකම් පරීක්ෂා කරනු ලැබීමෙන් පසු ඉහලම ලකුණු ලැබුවන් අතුරින් කුසලතා අනුපිළිවෙල අනුව බඳවාගනු ලැබේ. |
| 2. මහා මාර්ග නීති පිළිබඳව ප්‍රායෝගික දැනුම | 40 | |
| 3. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | 20 | |
| මුළු ලකුණු සංඛ්‍යාව | 100 | |

9.3.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය :
රජයේ ගැසට් පත්‍රයේ හෝ ප්‍රසිද්ධ පුවත්පත් වල පලකරනු ලබන දැන්වීමක් මගින්.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2013-05-21 දින
අනුමත කරන ලදි
ආණ්ඩුකාර ලේකම්

10. කාර්යක්ෂමතා කඩඉම් -

10.1

| කුමන කාර්යක්ෂමතා කඩඉම ද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත / වෘත්තීය / සහතික පාඨමාලා / වෙනත් |
|---|---|---|
| 1 වැනි කාර්යක්ෂමතා කඩඉම | III ශ්‍රේණියට බඳවාගෙන වසර තුන (03) ක් ගත වීමට පෙර | ලිඛිත (පරිශිෂ්ටය 02) |
| 2 වැනි කාර්යක්ෂමතා කඩඉම | II ශ්‍රේණියට උසස් වී වසර තුන (03) ක් ගත වීමට පෙර | ලිඛිත (පරිශිෂ්ටය 03) |
| 3 වැනි කාර්යක්ෂමතා කඩඉම | I ශ්‍රේණියට උසස් වී වසර පහ (05) ක් ගත වීමට පෙර | ලිඛිත (පරිශිෂ්ටය 04) |

10.2. කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද : වර්ෂයකට වරක් පවත්වනු ලැබේ.

10.3. කාර්යක්ෂමතා කඩඉම පවත්වන බලධරයා :

රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ බලය පවරන ලද බලධරයන් විසින්, නියමකරනු ලබන මාර්ගෝපදේශ පරිදි පරීක්ෂණ පවත්වනු ලැබේ.

11. භාෂා ප්‍රවීණතාව -

11.1

| භාෂාව | ලබා ගත යුතු ප්‍රවීණතාව |
|---|---|
| රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු සේවකයන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පරිවාස කාලය තුළ ලබා ගත යුතුය. |
| අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 හි විධිවිධානයන්ට අනුව ගරු ආණ්ඩුකාරතුමන් විසින් අනුමත අදාළ මට්ටමේ ප්‍රවීණතාව ලබා ගත යුතුය. |

12. ශ්‍රේණි උසස් කිරීම්

12.1 III වැනි ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට උසස් කිරීම

12.1.1. සාමාන්‍ය කාර්ය සාධනය අනුව

12.1.1.1. සපුරාලිය යුතු සුදුසුකම් :

(i) පත්වීම ස්ථිර කර තිබීම.

(ii) සේවක ගණයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය (10)ක් උපයාගෙන තිබීම.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2013-05-21 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

(iii) අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10)ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

(iv) උසස්වීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

(v) අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගෙන තිබීම.

(vi) අදාළ කාර්යක්‍ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත්වී තිබීම.

(vii) තාර බර හොණ්ඩර 34 දක්වා වන සැහැල්ලු ලොරි සහ මගීන් 32ට නොවැඩි සංඛ්‍යාවක් ගෙන යා හැකි බස් රථ සඳහා රියදුරු බලපත්‍ර ලබා තිබීම. (මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද ඒ 1 හා සී 1 පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව බී සහ ඩී 1 පන්තියේ බලපත්‍රයක් ලබා තිබීම.)

12.1.1.2. උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන සේවකයන් II ශ්‍රේණියට උසස් කිරීම, නියමිත ආකෘති පත්‍රය අනුව පත්කිරීම් බලධරයා වෙත අදාළ සේවකයා විසින් ඉල්ලීමක් කරනු ලැබූ විට පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මකවන පරිදි සිදුකරනු ලැබේ.

12.1.2. සුවිශේෂී කාර්ය සාධනය අනුව

12.1.2.1. සපුරාලිය යුතු සුදුසුකම් :

(i) පත්වීම ස්ථිර කර තිබීම.

(ii) සේවක ගණයේ III ශ්‍රේණියේ වසර හයක (06) සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත දිනට වැටුප් වර්ධක සියල්ල උපයාගෙන තිබීම.

(iii) අනුමත කාර්ය සාධනය ඇගයීමේ පරිපාටිය අනුව පූර්වාසන්න වසර හය (06) තුළම සුවිශේෂී කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

(iv) උසස්වීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

(v) අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත්වී තිබීම.

(vi) අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව නියමිත කාලය තුළදී ලබාගෙන තිබීම.

(vii) තාර බර හොණ්ඩර 34 දක්වා වන සැහැල්ලු ලොරි සහ මගීන් 32ට නොවැඩි සංඛ්‍යාවක් ගෙන යා හැකි බස් රථ සඳහා රියදුරු බලපත්‍ර ලබා තිබීම. (මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද ඒ 1 හා සී 1 පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව බී සහ ඩී 1 පන්තියේ බලපත්‍රයක් ලබා තිබීම.)

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2013-05-21 දින
අනුමත කරන ලදී
ආණ්ඩුකාර ලේකම්

12.1.2.2. උසස් කිරීමේ ක්‍රමය :

ඉහත සුදුසුකම් සපුරාලන සේවකයන්ට පත්කිරීම් බලධරයා අනුමත කරන ආයතනයක් විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයකට (පරිශිෂ්ටය 05) පෙනී සිටිය හැක. ඉන් සමත්වන්නන් විසින් නියමිත ආකෘතිපත්‍රය අනුව පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ. අදාළ සෙසු අවශ්‍යතාවන් ද සම්පූර්ණ කර ඇති සේවකයන් පත්කිරීමේ දින සිට වසර හයක් (06) සම්පූර්ණ වන දිනට ක්‍රියාත්මක වන පරිදි II ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදුකරනු ලැබේ.

සටහන :

* සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීම් ලබාදීමේදී පවත්වනු ලබන පරීක්ෂණයෙන් සමත්වීම සඳහා අවම වශයෙන් ලකුණු 60%ක් ලබා ගත යුතුය. තවද, සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීමේ පරීක්ෂණය වර්ෂයකට එක්වරක් පවත්වනු ලැබේ. එක් සේවකයෙකුට මෙම පරීක්ෂණයට පෙනී සිටිය හැක්කේ එක්වතාවක් පමණි.

* සේවකයෙකුට පාලනය කළ නොහැකි විශේෂ හේතුවක් මත නියමිත දිනට සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීමේ පරීක්ෂණයට පෙනී සිටීමට නොහැකි වූ අවස්ථාවන්හි දී පසුව පැවැත්වෙන අභියෝග්‍යතා පරීක්ෂණයට එම සේවකයාට පෙනී සිටිය හැක. එවැනි සේවකයෙකු සුවිශේෂී කාර්යසාධනය යටතේ උසස් කිරීම සිදුකරන දිනය ලෙස සලකනුයේ එම විභාගය සමත්වූ දිනය වේ. මේ සඳහා මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ එකඟතාව ලබාගත යුතුය.

12.2. II වන ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම.

12.2.1. සාමාන්‍ය කාර්ය සාධනය අනුව

12.2.1.1. සපුරාලිය යුතු සුදුසුකම් :

(i) සේවක ගණයේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර නවයක (09) සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක නවයක් (09) උපයාගෙන තිබීම.

(ii) අනුමත කාර්ය සාධනය ඇගයීමේ පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර නවයක් (09) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් හා පෙන්නුම් කර තිබීම.

(iii) උසස්වීම් දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණකර තිබීම.

(iv) අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත්වී තිබීම.

12.2.1.2. උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන සේවකයන් I ශ්‍රේණියට උසස් කිරීම සඳහා පත්කිරීම් බලධරයා වෙත අදාළ සේවකයා විසින් නියමිත ආකෘති පත්‍රය අනුව ඉල්ලීමක් කරනු ලැබූවිට පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදුකරනු ලැබේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2013-05-21 දින
අනුමත කරන ලදී
ආණ්ඩුකාර ලේකම්

12.2.2. සුවිශේෂී කාර්ය සාධනය අනුව :

12.2.2.1. සපුරාලිය යුතු සුදුසුකම් :

(i) සේවක ගණයේ II ශ්‍රේණියේ වසර අටක් (08) සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත දිනට වැටුප් වර්ධක අටක් (08) උපයාගෙන තිබීම.

(ii) අනුමත කාර්ය සාධන ඇගයීම් පරිපාටිය අනුව පූර්වාසන්න වසර අටක් (08) තුළම සුවිශේෂී කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

(iii) උසස්වීම් දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

(iv) අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත්වී තිබීම.

12.2.2.2. උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන සේවකයන් සඳහා පත්කිරීම් බලධරයා විසින් ලිඛිත පරීක්ෂණයක් (පරිශිෂ්ටය 06) පවත්වනු ලබන අතර එම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් 50% ක් හෝ ඊට වැඩි ලකුණු ප්‍රමාණයක් ලබාගන්නා සේවකයන් II ශ්‍රේණියට උසස් වී වසර අට (08) සම්පූර්ණ වන දින සිට ක්‍රියාත්මක වන පරිදි I ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදුකරනු ලැබේ.

සංලක්ෂ්‍යය (සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීම් සඳහා වන පරීක්ෂණ වලට පෙනී සිටීම) :

කාර්ය සාධනය ඇගයීමේ පොදු ක්‍රමවේදයක් රජය විසින් හඳුන්වාදී ක්‍රියාත්මක කරන තෙක් දැනට ක්‍රියාත්මක වන වාර්ෂික කාර්ය සාධන ඇගයීමේදී සතුටුදායක මට්ටම හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කරනු ලැබ ඇති තැනැත්තන්ට සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීම් සඳහා වන ලිඛිත අභියෝග්‍යතා පරීක්ෂණය/ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පෙනී සිටීමට අවස්ථාව සලසා දෙනු ලැබේ.

12.3. I වන ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරීම.

12.3.1. සාමාන්‍ය කාර්ය සාධනය අනුව

12.3.1.1. සපුරාලිය යුතු සුදුසුකම් :

(i) සේවක ගණයේ I ශ්‍රේණියේ අවම වශයෙන් වසර නවයක (09) සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක නවයක් (09) උපයාගෙන තිබීම.

(ii) අනුමත කාර්ය සාධනය ඇගයීමේ පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර නවයක් (09) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

(iii) උසස්වීම් දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සක්‍රිය සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

(iv) අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත්වී තිබීම.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2013-05-21 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

12.3.1.2. උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන සේවකයන් I ශ්‍රේණියට උසස් කිරීම සඳහා පත්කිරීම් බලධරයා වෙත අදාළ සේවකයා විසින් නියමිත ආකෘති පත්‍රය අනුව ඉල්ලීමක් කරනු ලැබූ විට පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදුකරනු ලැබේ.

13. තනතුරු වලට පත් කිරීම :

| තනතුරු නාමය | සම්පූර්ණ කළ යුතු සුදුසුකම් |
|---|---|
| 01. මෝටර් රථ රියදුරු<br>02. ජීප් රියදුරු<br>03. වෑන් රියදුරු | පෞද්ගලික/කුලී රථ සහ තාර බර හෝණ්ඩර 24ට අඩු ජ්වේෂන් වැගන් රථ පැදවීම පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද නිපුණතාවය පිළිබඳව සහතිකයක් ලබා තිබීම. (බඳවා ගන්නා දිනට වසර 03කට පෙර අවම වශයෙන් , මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද සී හා සී 1 වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව බී පන්තියේ බලපත්‍රයක් ලබා තිබීම.)<br>. |
| 01. ලොරි රියදුරු<br>02. ට්‍රැක්ටර් රථ රියදුරු<br>03. ගිලන් රථ රියදුරු | තාර බර හෝන්ඩර 34ට වැඩි බර මෝටර් වාහන බර ට්‍රේලර් සහ මගීන් 32ට නොවැඩි සංඛ්‍යාවක් ගෙනයා හැකි බස් රථ සඳහා රියදුරු බලපත්‍රයක් තිබීම.( බඳවා ගන්නා දිනට වසර 03කට පෙර අවම වශයෙන් , මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද ඒ වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව බී පන්තියේ බලපත්‍රයක් ලබා තිබීම.) |
| 03 රෝලර් රියදුරු<br>04. ඩෝසර් ක්‍රියාකරු<br>05. බැකෝ ලෝඩර් ක්‍රියාකරු<br>06. එන්ජින් රියදුරු<br>07. කැට් ඩෝසර් ක්‍රියාකරු<br>08. ජේ.සී.බී. ක්‍රියාකරු | තාර බර හෝන්ඩර 34ට වැඩි බර මෝටර් වාහන බර ට්‍රේලර් සහ මගීන් 32ට නොවැඩි සංඛ්‍යාවක් ගෙනයා හැකි බස් රථ සඳහා රියදුරු බලපත්‍රයක් තිබීම. (බඳවා ගන්නා දිනට වසර 03කට පෙර අවම වශයෙන් , මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද ඒ වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව බී පන්තියේ බලපත්‍රයක් ලබා තිබීම.)<br>හා<br>ඉහත බලපත්‍රයට අතිරේකව තනතුරට අදාළ වන යන්ත්‍ර ක්‍රියාකරවීම සම්බන්ධව රජය පිළිගත් ආයතනයකින් ( NAITA /ICTAD ) පුහුණුව ලැබූ බවට ( NVQ 4 මට්ටමට නොඅඩු ) සනාථ කරන සහතිකය |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2013-05-21 දින
අනුමත කරන ලදී
ආණ්ඩුකාර ලේකම්

14. සේවයේ යෙදී සිටින්නන් අන්තර්ග්‍රහණය කිරීම (ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින්නන්ට පමණක් අදාළවේ.) :

සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දින දක්වා කාලය තුළ මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවයට බඳවාගත් සහ ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය මත PL-03-2006 (A) වැටුප් ක්‍රමය ලබා දී ඇති පළාත් පාලන ආයතනවල රියදුරු සේවයේ සේවකයන් පහත දක්වා ඇති විධි විධාන යටතේ පළාත් පාලන රියදුරු සේවයට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

14.1. පොදු කරුණු :

I. අන්තර්ග්‍රහණය කිරීමට මනාපය පළ කරනු ලබන්නන් ආයතන ප්‍රධානියා මගින් මෙම ව්‍යවස්ථාවේ අටවන පරිශිෂ්ඨයේ දැක්වෙන ආකෘති පත්‍රයට අනුව අයදුම්පතක් ඉදිරිපත් කළ යුතුය.

II. ආයතන ප්‍රධානියා විසින් තමා වෙත ලැබෙන අයදුම්පත් මෙම ව්‍යවස්ථාව ප්‍රකාශයට පත්කිරීමෙන් මාස තුනක් (03) ඇතුළත මධ්‍යම පළාතේ පළාත් පාලන කොමසාරිස් වෙත එවිය යුතුයි.

III. මධ්‍යම පළාතේ පළාත් පාලන කොමසාරිස් විසින් ඉල්ලා සිටිනු ලබන වෙනත් අවශ්‍ය ලිපි ලේඛන හෝ විස්තර සැපයීමට ආයතන ප්‍රධානීන් කටයුතු කළ යුතුය.

IV. අන්තර්ග්‍රහණය කරනු ලබන සේවකයින්ට විධිමත් පත්වීමේ ලිපියක් මධ්‍යම පළාතේ පළාත් පාලන කොමසාරිස් විසින් නිකුත් කිරීමට කටයුතු කරනු ඇත.

14.2. ක්‍රමවේදය :

(i) III ශ්‍රේණිය :

(අ) PL-03-2006 (A) වැටුප් පරිමාණය යටතේ III ශ්‍රේණියට අදාළ වැටුප් නියමකර ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු දහයක (10) සේවා කාලයක් සම්පූර්ණ කර නැති සේවකයින්,

(ආ) PL-03-2006 (A) වැටුප් පරිමාණය යටතේ III ශ්‍රේණියට අදාළ වැටුප් නියමකර ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු දහයක (10) සේවා කාලයක් සම්පූර්ණ වුවද II ශ්‍රේණියට උසස් කිරීම සඳහා අවශ්‍ය සෙසු සුදුසුකම් සපුරා නොමැති සේවකයින්,

III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

(ii) II ශ්‍රේණිය :

(අ) PL-03-2006 (A) වැටුප් පරිමාණය යටතේ III ශ්‍රේණියට අදාළ වැටුප් නියමකර ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු දහයකට (10) නොඅඩු එහෙත් අවුරුදු විස්සකට (20) අඩු සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාළ කාලය තුළ වැටුප් වර්ධක සියල්ල උපයාගෙන ඇති හා නව සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීමට පෙර ක්‍රියාත්මකව පැවැති බඳවා ගැනීමේ පටිපාටිය/ ~~සේවා ව්‍යවස්ථාව~~ අනුව අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති සේවකයන්,

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2013-05-21 දින
අනුමත කරන ලදී
ආණ්ඩුකාර ලේකම්

(ආ) PL-03-2006 (A) වැටුප් පරිමාණයේ II ශ්‍රේණියට අදාළ වැටුප් නියමකර ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් වසර නවයක (09) සේවා කාලයක් සම්පූර්ණ කර නැති සේවකයන්,

(ඇ) PL-03-2006 (A) වැටුප් පරිමාණය යටතේ II ශ්‍රේණියට අදාළ වැටුප් නියමකර ඇති තනතුරක හෝ ශ්‍රේණියක සේවා කාලය වසර නවය (09) සම්පූර්ණ වුවද, ඉහත සඳහන් අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා නොමැති සේවකයන්,

II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

(iii) I ශ්‍රේණිය :

(අ) PL-03-2006 (A) වැටුප් පරිමාණය යටතේ III ශ්‍රේණියට අදාළ වැටුප් නියමකර ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු විස්සකට (20) නොඅඩු එහෙත් අවුරුදු තිහකට (30) අඩු සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාළ කාලය තුළ වැටුප් වර්ධක සියල්ල උපයාගෙන ඇති හා නව සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීමට පෙර ක්‍රියාත්මකව පැවැති බඳවා ගැනීමේ පටිපාටිය/සේවා ව්‍යවස්ථාව අනුව අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති සේවකයන්,

(ආ) PL-03-2006 (A) වැටුප් පරිමාණයේ II ශ්‍රේණියට අදාළ වැටුප් නියම කර ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් වසර නවයක (09) නොඅඩු එහෙත් අවුරුදු දහනවයකට (19) අඩු සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාළ කාලය තුළ වැටුප් වර්ධක සියල්ල උපයාගෙන ඇති හා නව සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීමට පෙර ක්‍රියාත්මකව පැවැති බඳවා ගැනීමේ පටිපාටිය/සේවා ව්‍යවස්ථාව අනුව අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති සේවකයන් සේවකයන්,

(ඇ) PL-03-2006 (A) වැටුප් පරිමාණය යටතේ I ශ්‍රේණියට අදාළ වැටුප් නියම කර ඇති තනතුරක හෝ ශ්‍රේණියක සේවා කාලය වසර නවය (09) සේවා කාලයක් සම්පූර්ණ කර නැති සේවකයන්,

(ඈ) PL-03-2006 (A) වැටුප් පරිමාණය යටතේ I ශ්‍රේණියට අදාළ වැටුප් නියම කර ඇති තනතුරක හෝ ශ්‍රේණියක සේවා කාලය වසර නවය (09) සම්පූර්ණ වුවද, ඉහත සඳහන් අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා නොමැති සේවකයන්,

I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

(iv) විශේෂ ශ්‍රේණිය :

(අ) PL-03-2006 (A) වැටුප් පරිමාණය යටතේ III ශ්‍රේණියට අදාළ වැටුප් නියමකර ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු තිහකට (30) නොඅඩු සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාළ කාලය තුළ වැටුප් වර්ධක සියල්ල උපයාගෙන ඇති හා නව සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීමට පෙර ක්‍රියාත්මකව පැවැති බඳවා ගැනීමේ පටිපාටිය/සේවා ව්‍යවස්ථාව අනුව අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති සේවකයන්,

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2013-05-21 දින
අනුමත කරන ලදී
ආණ්ඩුකාර ලේකම්

(ආ) PL-03-2006 (A) වැටුප් පරිමාණයේ II ශ්‍රේණියට අදාළ වැටුප් නියම කර ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් වසර ද හතවයකට (19) නොඅඩු සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාළ කාලය තුළ වැටුප් වර්ධක සියල්ල උපයාගෙන ඇති හා නව සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීමට පෙර ක්‍රියාත්මකව පැවැති බඳවා ගැනීමේ පටිපාටිය/ සේවා ව්‍යවස්ථාව අනුව අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති සේවකයන්,

(ඇ) PL-03-2006 (A) වැටුප් පරිමාණය යටතේ I ශ්‍රේණියට අදාළ වැටුප් නියමකර ඇති තනතුරක හෝ ශ්‍රේණියක සේවා කාලය වසර නවය (09) සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාළ කාලය තුළ වැටුප් වර්ධක සියල්ල උපයාගෙන ඇති හා නව සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීමට පෙර ක්‍රියාත්මකව පැවැති බඳවා ගැනීමේ පටිපාටිය/සේවා ව්‍යවස්ථාව අනුව අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති සේවකයන්,

(ඇ) PL-03-2006 (A) වැටුප් පරිමාණය යටතේ විශේෂ ශ්‍රේණියට අදාළ වැටුප් නියමකර ඇති තනතුරක හෝ ශ්‍රේණියක සේවය කරන සේවකයන්,

විශේෂ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

15. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් රෙගුලාසි මධ්‍යම පළාත් සභා මූල්‍ය රීති සහ රජය/ මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කලට පනවනු ලබන නීතිරීති හා/හෝ රෙගුලාසි අදාළවේ.

සටහන: මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල රියදුරු සේවා ව්‍යවස්ථාව මධ්‍යම පළාතේ එක් එක් පළාත් පාලන ආයතනයන්ට වෙන් වෙන් වශයෙන් සීමාවේ. උදාහරණයක් වශයෙන් මහනුවර මහ නගර සභාව සම්බන්ධයෙන් මහනුවර මහ නගර සභාවට පමණක් බල පැවැත්වෙන්නක් වන අතර, නුවරඑළිය ප්‍රාදේශීය සභාව සම්බන්ධයෙන් මෙය නුවරඑළිය ප්‍රාදේශීය සභාවට පමණක් බල පැවැත්වෙන්නක් වේ.

6. අන්තර්කාලීන විධිවිධාන.

16.1. අන්තර්ග්‍රහණ ක්‍රියාවලිය යටතේ මෙම සේවයට අන්තර්ග්‍රහණය වන සේවකයන් සඳහා මෙම ව්‍යවස්ථාවේ සඳහන් කාර්යක්ෂමතා කඩඉම් සහ අනෙකුත් අවශ්‍යතා සපුරාගත යුතුය. කෙසේ වෙතත් අන්තර්ග්‍රහණයට පෙර එම සේවකයන් සඳහා අනුමත බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත්ව ඇත්නම් මෙම ව්‍යවස්ථාවේ සඳහන් අදාළ කාර්යක්ෂමතා කඩඉමෙන් සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කෙරේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2013-05-21 දින
අනුමත කරන ලදී
ආණ්ඩුකාර ලේකම්

17. මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2011.12.23 දින අනුමත කර ලද ප්‍රාථමික ශිල්පීය සේවා ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව දැනටමත් මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතන වල රියදුරු සේවයේ සිදුකර ඇති අන්තර්ග්‍රහණය කිරීම් සියල්ලම මෙම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දින සිට අවලංගු කර මෙම ව්‍යවස්ථාවේ 14. ඡේදයේ සඳහන් පරිදි අන්තර්ග්‍රහණය කිරීම කළ යුතු වේ.

18. මෙම සේවා ව්‍යවස්ථාවේ විධි විධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල රියදුරු සේවා ව්‍යවස්ථාව 2013.04. ３０ දින රැස්වූ කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදි.

| නම | අත්සන |
|---|---|
| 01. එස්.බී. බැද්දේවෙල මහතා (සභාපති) | ........................................ |
| 02. ටී.වී. මාරිමුත්තු මහතා (සාමාජික) | ........................................ |
| 03. ඒ.එම්. ගෆූර් මහතා (සාමාජික) | ........................................ |
| 04. යූ.ඒ. බෝගහපිටිය මහතා (සාමාජික) | ........................................ |
| 05. පී.පී.එස්.ඒ. දිසානායක මිය(සාමාජික) | ........................................ |

මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය : අනුමත කරමි /

.........................................

ටිකිරි කොබ්බෑකඩුව
මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර
20/3.....05.....21......

## පරිශිෂ්ටය - 01

1 වන කොටස

| තනතුරු නාමය |
|---|
| 01. මෝටර් රථ රියදුරු |
| 02. ලොරි /ට්‍රැක්ටර් රථ රියදුරු |
| 03. රෝලර් රියදුරු |
| 04. ගිලන් රථ රියදුරු |
| 03. ඩෝසර් ක්‍රියාකරු |
| 07. බැකෝ ලෝඩර් ක්‍රියාකරු |
| 08. එන්ජින් රියදුරු |
| 09. කැට් ඩෝසර් ක්‍රියාකරු |
| 10. ජේ.සී.බී. ක්‍රියාකරු |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2013-05-21 දින
අනුමත කරන ලදී
ආණ්ඩුකාර ලේකම්

## පරිශිෂ්ටය - 02

පළාත් පාලන රියදුරු සේවයට බඳවා ගැනීමේ තරඟ විභාගය.

01. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | මුළු ලකුණු සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 1. මාර්ග නීති සහ මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | පැය 01 | 100 | 40% |
| 2. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | පැය 01 | 100 | 20% |

02. මෙම පරීක්ෂණය අදාළ පත්වීම් බලධාරියා විසින් පවත්වනු ලැබේ.

03. තරඟ විභාගයට තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ ප්‍රශ්න පත්‍ර දෙකකට පිළිතුරු සැපයිය යුතුවේ.

04. සාමාර්ථය සඳහා එක් එක් විෂයට නියමිත මුළු ලකුණු වලින් අවම වශයෙන් සියයට හතළිහක් (40%) ලබාගත යුතුවේ.

05. විභාගය සඳහා විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1. මාර්ග නීති සහ මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | මාර්ග නීති සහ මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම සම්බන්ධ බහුවර්ණ ප්‍රශ්න පත්‍රයකි. |
| 2. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම සම්බන්ධ බහුවරණ ප්‍රශ්න පත්‍රයකි |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2013-05-21 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම

## පරිශිෂ්ටය - 03

**පළාත් පාලන රියදුරු සේවයේ 01 වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය.**

01. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | මුළු ලකුණු සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 1. මෝටර් යාන්ත්‍රික විද්‍යාව, මාර්ග නීති සහ දෛනික ධාවන සටහන් පොත නඩත්තුව | පැය 01 | 100 | 40% |
| 2. ආයතන සංග්‍රහයේ සහවිනය කාර්ය සංග්‍රහයේ පළමුවන පරිච්ඡේදය, පළාත් මූල්‍ය රීති | පැය 1, 1/2 | 100 | 40% |

02. මෙම කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලැබේ.

03. අදාළ සේවයට ඇතුළත්වීම සඳහා වූ විභාගයට පෙනීසිටි භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් නිලධාරීන් විසින් ප්‍රශ්න පත්‍ර දෙකට පිළිතුරු සැපයිය යුතුවේ. තරග විභාගයක් නොමැතිව සේවයට බැඳුණු සේවකයන් තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ ප්‍රශ්න පත්‍ර දෙකකට පිළිතුරු සැපයිය යුතුවේ.

04. සේවකයන්ට තම කැමැත්ත පරිදි එක් එක් විෂය සඳහා වෙන වෙනම වාරවල දී විභාගයට පෙනී සිටිය හැකිවේ. එනෙකුදු වුවත් සාමාර්ථය සඳහා එක් එක් විෂයට නියමිත මුළු ලකුණුවලින් අවම වශයෙන් සියයට හතළිහක් (40%) ලබාගත යුතුවේ.

05. විභාගය සඳහා විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1. මෝටර් යාන්ත්‍රික විද්‍යාව, මාර්ග නීති සහ දෛනික ධාවන සටහන් පොත නඩත්තුව | මෝටර් යාන්ත්‍රික විද්‍යාව, මාර්ග නීති පිළිබඳව සහ දෛනික ධාවන සටහන් පොත නඩත්තුව පිළිබඳ බහුවරණ ප්‍රශ්න පත්‍රයකි. |
| 2. ආයතන සංග්‍රහය සහ පළාත් මූල්‍ය රීති | ආයතන සංග්‍රහයේ II, IV, VII, XII, XVI, XXI, XLVII, වන පරිච්ඡේද සහ පළාත් සභා මූල්‍ය රීති සංග්‍රහයේ 51, 52, 54 වගන්ති පිළිබඳ ප්‍රශ්න පත්‍රයකි. |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2013-05-21 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

## පරිශිෂ්ටය - 04

පළාත් පාලන රියදුරු සේවයේ 02 වැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය

01. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත්වීමට අවශ්‍ය අවම ලකුණුප්‍ර මාණය |
|---|---|---|---|
| 1. වාහනවල සුළු කාර්මික දෝෂ හඳුනා ගැනීම | පැය 01 | 100 | 40% |
| 2. ආයතන සංග්‍රහය හා පළාත් මූල්‍ය රීති | පැය 1 1/2 | 100 | 40% |

02. මෙම කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලැබේ.

03. අදාළ සේවයට ඇතුළත්වීම සඳහාවූ විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් සේවකයන් විසින් ප්‍රශ්න පත්‍ර දෙකකට පිළිතුරු සැපයිය යුතුවේ. තරග විභාගයක් නොමැතිව සේවයට බැඳුණු සේවකයන් තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ ප්‍රශ්න පත්‍ර දෙකකට පිළිතුරු සැපයිය යුතුවේ.

04. සේවකයන්ට තම කැමැත්ත පරිදි එක් එක් විෂය සඳහා වෙන වෙනම වාරවලදී විභාගයට පෙනීසිටීමට හැකිවේ. එනෙකුදු වුවත් සාමාර්ථය සඳහා එක් එක් විෂයට නියමිත මුළු ලකුණු වලින් අවම වශයෙන් සියයට හතළිහක් (40%) ලබාගත යුතු වේ.

05. විභාගය සඳහා විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1. වාහනවල සුළු කාර්මික දෝෂ හඳුනාගැනීම | වාහනවල සුළු කාර්මික දෝෂ හඳුනා ගැනීම පිළිබඳව බහුවර්ණ ප්‍රශ්න පත්‍රයකි. |
| 2. ආයතන සංග්‍රහය හා පළාත් මූල්‍ය රීති | ආයතන සංග්‍රහයේ II, IV, VII, XII, XVI, XXI, XLVII, වන පරිච්ඡේද සහ පළාත් සභා මූල්‍ය රීති සංග්‍රහයේ 51, 52, 54 වගන්ති පිළිබඳ ප්‍රශ්න පත්‍රයකි. |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2013-05-21 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

## <u>පරිශිෂ්ටය - 05</u>

පළාත් පාලන රියදුරු සේවයේ 03 වැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය.

01. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 1. වාහන නඩත්තු සහ වගකීම් කටයුතු පිළිබඳ දැනුම | පැය1 | 100 | 40% |
| 2. ආයතන සංග්‍රහය හා පළාත් මූල්‍ය රීති | පැය 1 1/2 | 100 | 40% |

02. මෙම කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලැබේ.

03. අදාළ සේවයට ඇතුළත්වීම සඳහාවූ විභාගයට පෙනීසිටි භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් සේවකයන් විසින් මෙම ප්‍රශ්න පත්‍ර දෙකට පිළිතුරු සැපයිය යුතුවේ. තරග විභාගයක් නොමැතිව සේවයට බැඳුනු සේවකයන් තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ පිළිතුරු සැපයිය යුතුවේ.

04. සාමාර්ථය සඳහා විෂයට නියමිත මුළු ලකුණු වලින් අවම වශයෙන් සියයට හතළිහක් ( 40%) ලබාගත යුතුවේ.

05. විභාගය සඳහා විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1. වාහන නඩත්තු සහ වගකීම් කටයුතු පිළිබඳ දැනුම | (i) මෝටර් රථ රියදුරන්ගේ රාජකාරි සහ වගකීම<br>(ii) රජයේ වාහන නඩත්තු කිරීම හා ආරක්ෂාව සම්බන්ධයෙන් රියදුරුගේ වගකීම<br>(iii) දෛනික ධාවන සටහන් පොත<br>(iv) වාහන ඉන්වෙන්ට්‍රි පවත්වාගෙන යාම<br>(v) වාහන අලුත්වැඩියාව හා සේවා කටයුතු<br>(vi) රජයේ වාහන වලට වන අනතුරු හා අනතුරු සම්බන්ධයෙන් ගතයුතු ක්‍රියාමාර්ගපිළිබඳවබහුවරණ ප්‍රශ්න පත්‍රයකි. |
| 2. ආයතන සංග්‍රහය හා පළාත් මූල්‍ය රීති | ආයතන සංග්‍රහයේ II, IV, VII, XII, XVI, XXI, XLVII, XLVIII වන පරිච්ඡේද සහ පළාත් සභා මූල්‍ය රීති සංග්‍රහයේ 51, 52, 54 වගන්ති පිළිබඳ ප්‍රශ්න පත්‍රයකි. |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
......2013-05-21.. දින
අනුමත කරන ලදි
ආණ්ඩුකාර ලේකම්

## පරිශිෂ්ටය - 06

III වැනි ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට උසස් කිරීමේ සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස්වීම් විභාගය.

01. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | මුළු ලකුණු සමත්වීමටඅවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 1. මෝටර් යාන්ත්‍රික විද්‍යාව, මාර්ග නීති සහ දෛනික ධාවන සටහන් පොත් නඩත්තුව | පැය 01 | 100 | 60% |
| 2. ආයතන සංග්‍රහය සහ පළාත් මූල්‍ය රීති | පැය 1 1/2 | 100 | 60% |

02. මෙම අභියෝග්‍යතා පරීක්ෂණය මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලැබේ.

03. විභාගය පවත්වනු ලබන්නේ වසරකට අවම වශයෙන් එක්වරක් පමණි.

04. අදාළ සේවයට ඇතුළත්වීම සඳහාවූ විභාගයට පෙනීසිටි භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් සේවකයන් විසින් මෙම ප්‍රශ්න පත්‍ර දෙකට පිළිතුරු සැපයිය යුතුවේ. තරග විභාගයක් නොමැතිව සේවයට බැඳුණු සේවකයන් තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ පිළිතුරු සැපයිය යුතුවේ.

05. විභාගය සඳහා විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේනම | විෂය නිර්දේශය |
|---|---|
| 1. මෝටර් යාන්ත්‍රික විද්‍යාව, මාර්ග නීති සහ දෛනික ධාවන සටහන් පොත නඩත්තුව | මෝටර් යාන්ත්‍රික විද්‍යාව, මාර්ග නීති පිළිබඳව සහ දෛනික ධාවන සටහන් පොත නඩත්තුව පිළිබඳ බහුවරණ ප්‍රශ්න පත්‍රයකි. |
| 2. ආයතන සංග්‍රහය සහ පළාත් මූල්‍ය රීති | ආයතන සංග්‍රහයේ II, VII, XII, XVI, XXIII, XLVII, XLVIII වන පරිච්ඡේද සහ පළාත් සභා මූල්‍ය රීති සංග්‍රහයේ 51, 52, 54 වගන්ති පිළිබඳ ප්‍රශ්න පත්‍රයකි. |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2013-05-21 දින
අනුමත කරන ලදි.
ආණ්ඩුකාර ලේකම්

## පරිශිෂ්ටය - 07

II වැනි ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීමේ සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස්වීම් විභාගය.

01. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | මුළු ලකුණු සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 1. වාහනවල සුළු කාර්මික දෝෂ හඳුනාගැනීම සහ වාහන නඩත්තුව පිළිබඳ දැනුම හා සුළු අළුත්වැඩියා හා අමතර කොටස් හඳුනා ගැනීම<br>2. මෝටර් යාන්ත්‍රික ශිල්පය පිළිබඳ සාමාන්‍ය දැනුම | පැය 01 | 100 | 50% |
| 1. ආයතන සංග්‍රහය හා පළාත් මූල්‍ය රීති<br>2. රියදුරෙකු විසින් සේවයේ යෙදීමේදී පිළිපැදිය යුතු කරුණු | පැය 1½ | 100 | 50% |
| 1. මාර්ග නීති සම්බන්ධ දැනුම.<br>2. හදිසි අවස්ථාවන්හිදි ගන්නා පියවර<br>3. රියදුරකුගේ එදිනෙද කාර්ය භාරය.<br>4. දෛනික ධාවන සටහන් පොත් පවත්වාගෙන යාම. | පැය 01 | 100 | 50% |

02. මෙම අභියෝග්‍යතා පරීක්ෂණය මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලැබේ.

03. විභාගය පවත්වනු ලබන්නේ වසරකට අවම වශයෙන් එක්වරක් පමණි.

04. අදාළ සේවයට ඇතුළත්වීම සඳහාවූ විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් සේවකයන් විසින් මෙම ප්‍රශ්න පත්‍රදෙකට පිළිතුරු සැපයිය යුතුවේ. තරග විභාගයක් නොමැතිව සේවයට බැඳුණු සේවකයන් තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ පිළිතුරු සැපයිය යුතුවේ.

05. විභාගය සඳහා විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1. වාහනවල සුළු කාර්මික දෝෂ හඳුනා ගැනීම සහ වාහන නඩත්තුව පිළිබඳ දැනුම | වාහනවල සුළු කාර්මික දෝෂ හඳුනා ගැනීම සහ වාහන නඩත්තුව පිළිබඳව බහුවරණ ප්‍රශ්න පත්‍රයකි. |
| 2. ආයතන සංග්‍රහය හා පළාත් මූල්‍ය රීති | ආයතන සංග්‍රහයේ II, IV, VII, XII, XVI, XXI, XLVII, XLVIII වන පරිච්ඡේද සහ පළාත් සභා මූල්‍ය රීති සංග්‍රහයේ 51, 52, 54 වගන්ති පිළිබඳ ප්‍රශ්න පත්‍රයකි. |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2013-05-21 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

# පරිශිෂ්ටය - 08

## මධ්‍යම පළාතේ පළාත් පාලන ආයතනවල රියදුරු ( ප්‍රාථමික ශිල්පීය ) සේවා ව්‍යවස්ථාව යටතේ දැනට සේවයේ සිටින සේවකයින් අන්තර්ග්‍රහණය කිරීම

( සේවකයාගේ පෞද්ගලික ලිපි ගොනුව ආශ්‍රයෙන් තොරතුරු ලබාගෙන මෙම ආකෘති පත්‍රය සම්පූර්ණ කර එම තොරතුරු සත්‍යාපන කර ගැනීම සඳහා ඔවුන් අන්තර්ග්‍රහණය කරනු ලබන ශ්‍රේණියට අදාල පත්වීම් ලිපියද අමුණා එවීමට කටයුතු කරන්න. අදාල නොවන වචන කපා හරින්න.)

01. සේවකයාගේ සම්පූර්ණ නම :-

02. සේවය කරන දෙපාර්තමේන්තුව :-

03. දැනට දරණ තනතුර හා ශ්‍රේණිය :-

04. එම ශ්‍රේණියට පත්වූ දිනය :-

05. සේවකයා දැනට ලබන වැටුප් ක්‍රමය :-

06. සේවකයා දැනට ලබන වාර්ෂික වැටුප :-

07. සේවය ස්ථිර කර තිබේද :-

08. යම් විනය නියෝගයක් මත හෝ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය අසමත්වීම නිසා සේවකයාගේ වැටුප් නතර කර තිබේද :-

09. වැටුප් වර්ධක නතර කර තිබේ නම් එම වැටුප් පියවර :-

10. මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ සේවකයෙක් ද එසේ නොමැති නම් මධ්‍යම පළාත් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය වූ සේවකයෙක් ද යන්න :-

11. අන්තර්ග්‍රහණය කරණු ලබන්නේ මෙම ව්‍යවස්ථාවේ 14:2 හි කුමන උප වගන්තිය යටතේද යන්න :-

12 මෙම ව්‍යවස්ථාවේ 14:2 උප වගන්තියේ සඳහන් සේවා කාලයට අමතරව අනෙකුත් සේවා අවශ්‍යතා සම්පූර්ණ කර ඇත්ද යන්න :-

ඉහත නම් සඳහන් ................................සේවක මහතා ............................ සභාවේ සේවයේ යොදවා ඇති බවත්, පෞද්ගලික ලිපි ගොනුවේ සඳහන් විස්තරවලට අනුව ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවත්, අංක 14 ජේදයේ........................... උප වගන්තිය යටතේ මෝටර් රථ රියදුරු සේවයේ ........................ ශ්‍රේණියට ........................................ දින සිට අන්තර්ග්‍රහණය කිරීම නිර්දේශ කරමි.

| | | |
|---|---|---|
| ........................................ | ගරු ආණ්ඩුකාරතුමා විසින් | ........................................ |
| දිනය | 2013-05-21 ........ දින | නාගරික කොමසාරිස් / ලේකම් |
| | අනුමත කරනු ලදී. | |
| | ආණ්ඩුකාර ලේකම් | |